# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 ඔක්තෝබර් 06 | චක්‍රලේඛය | 2021 අංක 09**

## කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් සහන දීර්ඝ කිරීම

ශ්‍රී ලංකාව තුල කොවිඩ්-19 ව්‍යසනයේ අඛණ්ඩව පැවතීම හේතුවෙන් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන දීර්ඝ කිරීමට රජයේ ආයතන සහ අනෙකුත් පාර්ශ්වයන් රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව, ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දෙනු ලබන අභියෝග සලකා බලමින් ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට පහත ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) දීර්ඝ කිරීමට කටයුතු කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලා සිටී.

තවද, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයන්ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීමට බැංකු නොවන මූල්‍ය ආයතන හට හැකියාව ඇත. ඒ අනුව, බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ණය නිසි අයුරින් ආපසු ගෙවීමේ දී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින්, බලපෑමට ලක් වූ සියලු ණය ගනුදෙනුකරුවන් සඳහා ඒකාකාරීව සහන සැලසීමට මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

### 1. සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්

1.1 කොවිඩ්-19 හේතුවෙන් ආදායම්/ වැටුප් හෝ විකුණුම් අහිමි වීම හෝ අඩු වීම, ව්‍යාපාර වසා දැමීම හෝ රැකියාව අහිමි වීම වැනි මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන, බැංකු නොවන මූල්‍ය ආයතනයක ණය ගනුදෙනුකරුවෙකු මෙම සහන ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

1.2 2021 අංක 04 සහ අංක 05 දරන චක්‍රලේඛ යටතේ සහන ලැබූ, ප්‍රවාහන සහ සංචාරක ක්ෂේත්‍රයන්හි සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් ද මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලැබීමට සුදුසුකම් ලබයි.

### 2. සුදුසුකම් ලබන සහන

2.1 මෙම යෝජනා ක්‍රමය යටතේ සහන සඳහා තෝරා ගැනෙන සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් පහත දී විකල්ප තුන අතරින් එකක් තෝරා ගත යුතු වේ.

**(i) විකල්ප අංක 01 : ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම**

(අ) ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ දෙපාර්ශ්වය විසින් එකඟ වන පිළිගත හැකි නඟා සිටුවීමේ සැලැස්ම සලකා බලමින්, බැංකු නොවන මූල්‍ය ආයතන

විසින් පවතින ණය පහසුකම් (2021 ඔක්තෝබර් 01 දිනට පවතින සක්‍රීය සහ අක්‍රීය ණය පහසුකම්) දිගු කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

(ආ) ඉහත 2.1 (i) (අ) සඳහා අදාළ වන පොළී අනුපාතය, වසරකට සියයට 11.5 ක අවමයකට සහ වසරකට සියයට 15 ක උපරිමයකට යටත්ව, වසරකට මුල් ගිවිසුම්ගත පොළී අනුපාතයෙන් සියයට තුනක් අඩු කළ අගය විය යුතුය.

(ඇ) ප්‍රතිව්‍යුහගත නියමයන්ට අනුව වාරිකයේ මුල් මුදල් කොටස ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් මාස 3 ක සහන කාලයක් ලබා දිය යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මින් පෙර ණය සහන යෝජනා ක්‍රම (එනම්, ණය සහන කාලය තුළ දී මුල් මුදල, පොලිය සහ ණය සහන කාලයට/කල් දැමීමට අදාළ පොලිය) තුළ දී ගෙවිය යුතු වූ අගයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ගෙවිය යුතු මුල් මුදලෙහි ශේෂයට එකතු කළ හැක.

(ඉ) එකඟ වූ නියමයන්ට අනුව වාරිකය ආපසු ගෙවීමට නොහැකි වීම මත අය කරන අතිරේක පොලිය, වසරකට සියයට 2 ඉක්ම නොවිය යුතු අතර, හිඟ අගය මත පමණක් අය කළ යුතුය.

(ඊ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2020 අප්‍රේල් 01 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා යන කාලය තුළ දී එකතුකර ඇති හෝ අය කරන ලද දඩ පොලිය කපා හැරිය යුතුය.

**(ii) විකල්ප අංක 02 : පූර්ව පියවීම සඳහා පහසුකම් සැලසීම**

සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවෙකු විසින් 2022 මාර්තු 31 වන දිනට හෝ ඊට පෙර පවතින ණය පහසුකම් සම්පූර්ණයෙන් පියවීමට කැමැත්ත දක්වන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අනාගත පොලිය, ගාස්තු සහ අදාළ වන ගාස්තු සම්පූර්ණයෙන් අය කිරීමෙන් වැලකී සිටීමට කටයුතු කළ යුතුය.

**(iii) විකල්ප අංක 03 : 2021 ඔක්තෝබර් 01 දිනට පවතින සක්‍රීය ණය පහසුකම් සඳහා ණය සහන කාලය දීර්ඝ කිරීම**

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මුල් මුදල, පොලිය නැතහොත් එම කොටස් දෙකම 2022 මාර්තු 31 දක්වා කල් දැමිය යුතුය.

(ආ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලය තුළ ගෙවිය යුතු වන මුල් මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඇ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මින් පෙර ණය සහන යෝජනා ක්‍රම තුළ දී ගෙවිය යුතු වූ අගයන් (එනම්, ණය සහන කාලය තුළ දී මුල් මුදල, පොලිය සහ ණය සහන කාලයට/කල් දැමීමට අදාළ පොලිය) සහ ඉහත 2.1 (iii) (ආ) හි සඳහන් කළ කාලීන ණයට එකතු කර නව ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන වලට මෙම නව ණය සඳහා සියයට 11.5 නොඉක්මවූ පොලියක් අය කිරීමේ හැකියාව පවතී.

(ඉ) බැංකු නොවන මූල්‍ය ආයතනයන් ඉහත 2.1(iii) (ඇ) හි දැක්වෙන නව ණය නැවත ගෙවීම මාස 12ක අවම ආපසු ගෙවීමේ කාලයක් සමඟ 2022 ජූලි 01 දින සිට ආරම්භ කළ යුතුය.

(ඊ) ණය ගනුදෙනුකරු විසින් 2022 අප්‍රේල් 01 දින සිට දැනට පවතින ණය වාරිකය ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

(උ) 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 මාර්තු 31 දින දක්වා පියවීමට ඇති පිළිවැටුම් ණය පහසුකම් (Revolving Credit Facilities) 2022 මාර්තු 31 දින දක්වා දීර්ඝ කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ඌ) ණය සහන කාලය තුළ දඩ පොලී එකතු කිරීම සහ අය කිරීම නොකළ යුතුය.

2.2 **නැවත අයකර ගැනීම් අත්හිටුවීම:** 2020 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ණය පහසුකමක් අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර ඇත්නම් සහ අදාළ ණය ගනුදෙනුකරුවන්ගේ ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා බාධාවන් සිදු වීම හේතුවෙන් ණය අඛණ්ඩව ආපසු ගෙවීමට/ එසැනින් ආපසු ගෙවීම ආරම්භ කිරීමට හැකි තත්ත්වයක නොසිටී නම්, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම් සඳහා වන නැවත අය කර ගැනීම් බැංකු නොවන මූල්‍ය ආයතන 2022 මාර්තු 31 දින දක්වා අත්හිටුවිය යුතුය.

## 3. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම

3.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

3.2 මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගනුදෙනුකරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල් දැමීම/ ප්‍රතිව්‍යුහගත කිරීම වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කර සකස් කළ යුතු වේ.

## 4. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය සහ අභියාචනා පටිපාටිය

4.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම චක්‍රලේඛය වැඩ කරන දින 3 ක් තුළ සියලුම ශාඛා අතර සංසරණය කළ යුතු අතර, අවශ්‍ය අභ්‍යන්තර මාර්ගෝපදේශ/ අභ්‍යන්තර චක්‍රලේඛ දින 7ක් ඇතුළත සැපයිය යුතු වේ.

4.2 ඉහත සඳහන් පළමුවන විකල්පය හෝ තුන්වන විකල්පය යටතේ ණය සහන ලබා ගැනීමට අපේක්ෂිත සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් 2021 නොවැම්බර් 01 දින හෝ ඊට පෙර ලිඛිත හෝ විද්‍යුත් මාර්ගයන්ගෙන් ඉල්ලුම් කළ යුතු වේ. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම ණය සහනයන් සඳහා අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත

සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුළත්ව) සන්නිවේදනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

4.3 සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 නොවැම්බර් 01 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

4.4 ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර, ණය සහන පහසුකම කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුම්වත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

4.5 ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ දී, ඒ සඳහා හේතු ලිඛිත හෝ විද්‍යුත් මාර්ගයන්ගෙන් පැහැදිලිව සඳහන් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

4.6 අයදුම්පත ප්‍රතික්ෂේප වූ විටක, එවැනි ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අභියාචනය කිරීමට අවස්ථාවක් ඇති වග ණය ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය.

### 5. ණය සහන කාල සීමාව සම්බන්ධ ගිණුම් තැබීම

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාල සීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද ලිපියේ අන්තර්ගත අතිරේක උපදෙස් අනුව කටයුතු කළ යුතුය. අවදානම ඉහළ ණය ගනුදෙනුකරුවන් හෝ අංශ සම්බන්ධයෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ප්‍රමාණවත් වෙන් කිරීම් කළ යුතු වේ. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක්/පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

### 6. වාර්තාකරණ අවශ්‍යතා

2021 නොවැම්බර් 30 දින සිට වැඩකරන දින 15ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සෑම මසකම 30 දිනට එම ආයතනවලින් ණය සහන ලබාගෙන ඇති ණය ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

අත්සන් කළේ,
**නිවාඩ් අජිත් ලෙස්ලී කබ්රාල්**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*